

එදත් වැහි දවසක්

දැන් අපගේ පාත්තිවල නොයෙකුත් භෝග වැවී ඇත. බණ්ඩක්කා කරල් උඩ බලාගෙන සිටින අතර වම්බටු කරල් බිම බලාගෙන ය. පිපිඤ්ඤා ගෙඩි බිම දිගැදී සිටිය ද වැඩි කලක් එසේ සිටීමට නොහැකි ය. ඒවා ගිටිගමන් අන්තඃස්ථාන වේ. බතල කඳු දෙකක වැල් පිරි ඇත. මඤ්ඤොක්කා කොටුවෙහි පඳුරු අතර ඇති පරතරය අප සිරුරට දෙන සුවය අපමණ ය. ඉතාමත් සිසිල් ය.

''ඒ'' පන්තියේ පාත්තිවලට වඩා අප පන්තියේ පාත්ති සරුසාර ය. එම සරුසාර කම තුළ අප පිම්බී සිටිය ද එය ද අපට විගිළු කිරීමට හේතුවක් කර ගෙන තිබිණි. ''මොළේ නතේ - කඳ තිබෙනේ'' යනුවෙන් ''ඒ'' පන්තියේ ළමයි අපට වතුවැඩ පීරියඩ් එකේ දී විගිළු කළෝ ය.

මෙම පාත්තිවල එළවළු ගෙන යෑම පිණිස අතුර ඉරිදා පොළේ බඩු විකුණන අම්මා කෙනෙකුගේ පැමිණීම සිරිතක් කරගෙන තිබිණ. ඒවා විකුණාන්නේ ලොකු මහතා ය. එළවළු විකුණා ලබාගත් මුදල්වලින් පන්තියේ සියලු දෙනාට ම පිටු හතළිහේ තනි රූළි අභ්‍යාස පොත බැගින් තෑගි දුන්නේ ද ලොකු මහතා පන්තියට පැමිණ ම ය. අප හිතන ආකාරයට මෙම එළවළුවලින් කොටසක් ගුරු මණ්ඩලය අතර ද බෙදෙන්නට ඇතැයි අප අනුමාන කළේ එළවළු කැඩූ දිනවල දී ගුරුවරගුරුවරියන් කීප දෙනෙකු ම වැඩිපුර පාර්සලයක් ගෙන යන බැවිනි.

එදා ද වර්ෂා දිනයකි. පාන්දර සිට ම වැටුණු මහා වර්ෂාව අතරට චුරුද,චුරුද පොදයත් නොකඩවා පැවතිණි. එහෙම දිනවලට ළමයින්ගේ පැමිණීම බොහෝ අඩු ය. එමෙන් ම ගුරු-වරුන්ගේ පැමිණීම ද අඩු ය. නිවසේ කුඩයක් තිබෙන සමහර ළමයි එම කුඩ ඉහළා ගෙන පැමිණෙති. එහෙත් කුඩය යනු ඉතාමත් වටිනා අනර්ඝතම වස්තුවක් ලෙස සලකන බැවින් ළමයි න්ට පාසල් ගෙන ඒමට දීමට බොහෝ දෙමව්පියෝ අකමැති වෙති.

මෙවන් දිනවල දී අපට හබරල අත්ත සහ කෙසෙල් අත්ත වර්ෂාවෙන් බේරීම සඳහා බෙ-

හෙවින් ප්‍රයෝජනවත් වෙයි. සමහරවිට පොඳ වැස්සෙන් බේරීම සඳහා ලොකු හබරල අත්තක් යට දෙතුන් දෙනෙකු ගමන් කරනවා දැකගත හැකි ය.

එදින මා ද පාසලට පැමිණියේ හබරල අත්තක් ගිසට කරගෙන ය. පාසලට එක දිනක් හෝ නොගොසින් සිටි මට මගේ පැවතියේ බලවත් අකමැත්තකි. වෙනදාට පැමිණෙන ළමයින් ප්‍රමාණය අනුව එදා පැමිණියේ ඉතාමත් ටික දෙනෙකි. මිදුල මැද අඹ ගහ යට හබරල අතු සහ කෙසෙල් අතු තරමක ප්‍රමාණයක් ගොඩ ගසා ඇත.

ගුරු මණ්ඩලයේ පැමිණීම ද බෙහෙවින් ම අඩු එවැනි දිනවලට කිසියම් වූ කැමැත්තක් අපගේ යටි සිතේ ද නොතිබුණා නොවේ. එදිනට පංතියට ගුරුවරයෙකු එන්නේ කලාතුරකිනි. මදටිය පෙළීම, ගල් පෙළීම, මැදැගිලි ඇල්ලීම වැනි ක්‍රීඩාවන් කරන අතර ම බස් ටිකට්වල නොමිමර ඇල්ලීම, ළමයින්ට උසුළුවිසුළු කිරීම, කඩදාසි ගුළිවලින් ගහ ගැනීම, පුංචි පුංචි රණ්ඩු ඇතිකර ගැනීම ආදී ක්‍රීඩාවන්ට අප යොමු වන්නේ නිරායාසයෙනි.

එදින අපගේ පන්තියේ වැඩි පිරිසක් ද නොසිටි අතර එම පිරිස අට දෙනෙකුට සීමා විය. ගැහැනු ළමයින් තිදෙනෙකු පැමිණ සිටි අතර මා ද ඇතුළුව පිරිමි ළමයින් සිටියේ පස් දෙනෙකි. අප පංතියේ ගුරුතුමිය වන පෙරේරා මහත්මියටත් ඒමට නොහැකි වී ඇත. කෑකෝ ගසමින් සිටි පීරියඩ් දෙකක් අවසන් ය. විජේදාසගේ යෝජනාවක් අනුව පන්තියේ සිටි අපි පිරිමි ළමයින් පස් දෙනා එළවළු පාත්ති පැත්තට ගියෙමු. ළපටි බණ්ඩක්කා කරල් දෙකක් කඩාගත් විජේදාස හෙවත් අඹතැරියා එය දෙක තුනට කඩා සියල්ලට ම බෙදුවේ ය. අපි අමු බණ්ඩක්කා කරල් හප කර ගිල්ලෙමු.

අප පාත්තිවලට තරමක් එහායින් පාත්තියක මඤ්ඤොක්කා ගාලකි.

''ඒයි බොලේ අපි වැඩක් කම්මු.''
''මොකක්ද?'' අපි සියලු දෙනා එකට ම විමසුවෙමු.
''මඤ්ඤොක්කා කමු''
''අමුවෙන් කන්න බෑනෙ යකෝ.''
''තම්බල කමු, පැලට යං''
''මං ගිහිං උදුරං එන්නං'' කියා විජේදාස ඉදිරියට ගියේය. ඔහු පිටුපසින් මුනිදාස හෙවත් මන්නේද ගියේ ය.

ඉතිරි අපි තුන්දෙනා පැලට ගියෙමු. පැලෙහි ඇති මැස්ස උඩ තිබුණු හට්ටිය අතට අරගෙන හරවා බැලුවේ අරනෝලිස් හෙවත් කබරයා ය. පැලේ මැස්ස උඩ වාඩිවූ අප තිදෙන විමසුම් සහිතව සිටියේ අඹතැරියා සහ මන්නේ එන තෙක් ය.

ලොකු මඤ්ඤොක්කා පඳුරු දෙකක අල, මැදින් කඩා ගත් ගස් සමග ම කරේ තබාගෙන ආවේ මන්නේ ය. පුංචි කතුරු පිහියක් මන්නේගේ සාක්කුවේ තිතර ම ඇත. මඤ්ඤොක්කා අල ටික සුද්ද කිරීමට අප සැම දෙනා ම හවුල් වුණෙමු. මන්නේ කපා දුන් අල කැබැල්ල මැදින් ගැසූ ඉරෙන් අලය සුද්ධ කිරීම අපි තරගයට මෙන් කළෙමු.

වතුර ගෙනැවිත් අලටික සෝදා මුට්ටියට දමා ළිප තැබුවේ ද මන්නේ ම ය. පොල් අතු අස්සේ ගසා තිබූ ගිනිපෙට්ටිය ගින්දර සඳහා අපට පිහිට විය. ගිනි මොළවා ළිප තබන ලද මඤ්ඤොක්කා ටික තැම්බෙන තුරු අපට දැන් ඉවසුමක් නැත. අපි ළිප වටකොට ගිනි ඇවිලීමට උදව් කළෙමු.
මඤ්ඤොක්කා තැම්බෙන විට විසිරි යන සුවඳ අපගේ දිව මොළවයි.
''කපා ගෙන එන ලද කෙසෙල් අතු කැබැල්ලක් මැස්ස උඩ තබා, තැම්බූ මඤ්ඤොක්කා ඒ මත හැලුවේ මන්නේ ම ය. මේ වැඩ පිළිබඳ ව මන්නේට කිසියම් වූ පුරුද්දක් තිබුණු බව අපට පෙනේ. ඔහු දක්ෂ ලෙස මුල් වී සියල්ල කරයි.

''ඒයි බඩයො කන්නෙ නිකංද?'' මගෙන් ඇසුවේ අඹතැරියා ය.
''නිකං කමු''
''කොච්චි කඩං කමු''
''අන්න හරි''
''උඹ කැන්දකොළ කඩපන්. මං කොච්චි ගේන්නං.''
මඩකරියා මට පවසා පිටත් වුණේ කොච්චි කඩා ගෙන ඒමට ය. අප පාත්තිවල කොච්චි ගිටුවා නැත. කොච්චි තිබෙන්නේ ලොකු මහතා නැවතී සිටින ගුරු නිවාසය අසල පාත්තියක ය. එය ළමයි ගිටවපු පාත්තියක් නොවේ. ලොකු මහතා විසින් ම වවන ලද කොච්චි ගස් දෙකක් අප දැක ඇත. ලොකු මහතාගේ මිදුල හරහා එහෙට මෙහෙට යන අවස්ථාවල කොච්චි ඉදි රතු පාටින් බැබළී බැබළී තිබෙන ආකාරයෙන් අප නෙත් වයි කළ අවස්ථා බොහෝ ය. මඩකරියා ගියේ එම ගස්වලින් කඩාගෙන ඒමට ය.

නිවසේ දී වැඩිගිටි අය බත් බුදින විට පවා කොච්චි රස කරමින් විකන අවස්ථා අප දැක ඇත්තෙමු. සමහර අය බත් කන විට කොච්චි කරල් කීපයක් නොතිබුණොත් එහි අඩුවක් ලෙස සලකන බව අපි දැක ඇත්තෙමු.
මම කැන්ද කොළ මිටියක් කඩාගෙන පැමිණියෙමි. එතැන කැන්ද කොළ විසිපහකට වැඩිය තිබෙන්නට ඇත. අප සිටියේ පස් දෙනා වුවද කැන්ද කොළ කැඩීමේ දී ඒ ගැන සිතීමට බැරි විය.

මා කැන්ද කොළ කඩාගෙන එන විට ම වාගේ මඩකරියා ද දුවගෙන ආවේ ය. ඔහුගේ කලිසම් සාක්කු දෙකෙන් එළියට ගත්තේ ඉදි රතු පාටින් දිලිසෙන කොච්චි කරල් ය. සාක්කු දෙක පිරෙන්නට ම කොච්චි ද කඩාගෙන ඇත. ඒවා මැස්ස උඩ මඤ්ඤොක්කා තිබූ කෙසෙල් කොළය උඩින් ම තැබුවේ ය.

මඤ්ඤොක්කා බෙදුවේ ද මන්නේ ම ය. අප සැමට කැන්ද කොළ මතට කැලි දෙකක් පමණ වනසේ දැමූ ඔහු ''කමු ඩෝ'' යනුවෙන් පවසා මඤ්ඤොක්කා කෑල්ලක් ගෙන කටට විසිකොට කටතුළ එහෙට මෙහෙට පෙරළන්නට වූයේ නවමත් පවතින රස්නය නිසා ය.

''වැඩියෙන් කොච්චි කන්න පුළුවන් කාටද?''
''මට''
''නෑ මටයි''
''මම කරල් දහයක් කනවා''
''මං විස්සක් කන්නං''
හැම දෙයකට ම ඔට්ටු දැමීමට පුරුදුව සිටි අපි කොච්චි කෑම ද ඔට්ටුවට කරන්නට ලෑස්ති වුණෙමු. මඤ්ඤොක්කා බෙදූ කැන්ද කොළ මතට කොච්චි කරල් දහය බැගින් ගැන දැමුවේ ද මන්නේ ය.

දැන් අප තරගයට මංකොක්කා සහ කොච්චි කෑමට සූදානම් ය.

''ඔන්න, එකායි, දෙකායි, තුනයි පටන් ගමිමු.'' මඩකරියාගේ කටහඬ අනුව අපි සියලු දෙනා ම කොච්චි කරල් දෙක බැගින් අතට ගෙන කටට දමා ගත්තෙමු. තම තමන් කොච්චි කෑමේ හපන්කම පෙන්වීමට හැම දෙනා ම උත්සුක වී ඇත.

ගත වූයේ මොහොතකි. තම අත තිබූ කැන්ද කොළ මැස්ස උඩ ම අතැර දැමූ අපි මහා ශබ්දයෙන් කෑ ගසමින් කොච්චි සැර ඉවසීමට බැරුව වතුර බොන්නට පටන් ගතිමු. හැම කෙනෙකුගේ ම කටවල් ඇරිලාය. ''හා.... හි....අම්මෝ..... දනවෝ.... හැම මුවකින් ම කිසියම් හෝ ශබ්දයක් පිටවෙයි.

කොතෙක් වතුර බීවත් සැර නැති වන්නේ නැත. දැන් එකා දෙන්නා බිම පෙරළී කෑ ගසති. කරකියා ගන්නට දෙයක් නැත. පන්තියට යෑමටත් නොහැකි ය. කතා කිරීමටත් නොහැකි ය. අපි සියල්ලෝ ම බිම පෙරැළී බිම දිගා වී කටින් නොයෙකුත් ආකාරයේ ශබ්ද කරමින් දැගලුවෙමු.

සරමක් පමණක් ඇඳගෙන එය වලාපොට ගසාගෙන සාළුවක් කරේ දමාගත් උඩු රැවුලක් තිබෙන කළු පාට හැඩිදැඩි අයෙකු අප ඉදිරියට එනවා අපට පෙනෙයි. අපට නැගිට ගැනීමට හෝ බැරි ය. නැගිටින කෙනා නැවත බිම පෙරැළෙයි.

අප ළඟට පැමිණි එම පුද්ගලයා මොහොතක් අප දෙස බලා කතා කළේ ය.

''ළමයිනේ මොකෝ, මොකෝ'' උඹලට මොකෝ, කියපල්ලා'' ඔහු බොහෝ සේ බියපත් මුහුණකින් ඇසුවේ සැම දෙනා දෙස ම විමසිල්ලෙන් බලමින් ය.
එහෙත් අප කිසිවෙකුට කතා කිරීමට බැරි ය. කතා කරන්නට හැදුවත් එය අබ්බවා කොච්චි සැර මතුවෙයි.

පැමිණි කෙනා වහා ලොකු මහතාගේ කාමරය පැත්තට දුව යනවා අපට පෙනේ. ස්වල්ප වේලාවකි න් ලොකු මහතා සහ තවත් ගුරු-වරයෙකු ද එනු අපට පෙනේ. ඒ පසුපසින් ළමයි ද පැමිණෙති. ලජ්ජාවට ද වැඩියෙන් කොච්චි සැර වැඩි ය.
දැන් ලොකු මහතා ඇතුළු සැමට විසඳා ගත නොහැකි ගැටලුවකි. එහෙට මෙහෙට පනින ලොකු මහතා අපව ඔසවාගෙන යන ලෙස ළමයි න්ට විධාන කරනවාත් සමගම පැල ඇතුළින් මතුවූ සිළුවා සර් මඤ්ඤොක්කා පිරුණු කැන්ද කොළයක් සහ කොච්චි අනුරක් අත් දෙකට රැගෙන ඉදිරියට ආවේ ය.

සිදු වී ඇති සිද්ධිය එබී බැලූ සියල්ලට ම වැටහිණි. එකිනෙකාගේ මුහුණුවල මෝදු වී ආ සිනහව මහා විශාල සිනා වර්ෂාවක් බවට පත් විණි. අපි අමාරුවෙන් නැගිට ඉතා අසීරු ලීලාවෙන් කටින් සැර පිට කරමින් ඇඹරුණෙමු.

''හොඳ වැඩේ ගොන්කම් කරනවට හොඳ දඬුවම'' පැවසූ ලොකු මහතා ''මොකුත් කරන්න එපා සැර යනකං ඔහේ ගිටපුවාවෙ.'' යනුවෙන් පවසා ''ඔක්කොම ඔෆීසියට යනවලා''යි අපට විධාන කොට අනිත් පිරිස ද සමග පාසල් ගොඩනැගිලි පැත්තට පා නැගුවේ ය.

කාර්යාලය අසල බංකුවක වාඩි කරවූ අප පාසල ඇරෙන තුරු කොච්චි සැර විඳිමින් සිටියෙමු. දැන් කොච්චි සැරවත් වඩා ළමයින් එපිට සිට අප දෙස බලමින් කරන විලිස්සීම ඉවසා සිටිය හැකි නොවේ. වැඩි බර ගතිය නිසා වදින පාසල කලින් ඇරිම අපගේ සතුටට හේතු විය. බෙල් එක ගසනවාත් සමග ම අප සියලු දෙනා ම වහා ඉවත් වී වේගයෙන් දුවගොස් අනෙක් අයට නොපෙනෙන තැනක සැඟවුණේ පිරිස ගියාට පසු පොත්පත් රැගෙන යාමට ආපසු පැමිණිය යුතු නිසා ය.

විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com